# 13 දස පනත



13.1 රූපය - සීනයි කඳු මුදුනේ දී දස පනත ලබාදීම

මෙම චිත්‍රය මඟින් පෙන්නුම් කරන්නේ, සීනයි කඳු මුදුනේ දී දෙවියන් වහන්සේ මෝසෙස් තුමාට දස පනත දුන් ආකාරය යි. මෝසෙස් තුමා දස පනත ලබා ගැනීමට පෙර දින 40ක් යාච්ඤා කළේ ය.

යහපත් ජීවිතයක් ගත කිරීමට මඟ පෙන්වීම සඳහා දෙවියන් වහන්සේ අපට දස පනත දුන් සේක. දේව ප්‍රේමය පදනම් කරගනිමින් අසල්වැසියන්ට ප්‍රේම කිරීම, කිතු දහමේ මූලික ඉගැන්වීම යි. ඒ සඳහා දේව පනත් අනුසාර කළ යුතු ය.

## දස පනත

### පළමු පනත් තුන

1. සැබෑ වූ එක ම දෙවියන්ට පමණක් වන්දනා කරව
2. දෙවියන් වහන්සේගේ ශ්‍රී නාමය ගැන බොරුවටවත් නිරන්තරයටවත් නොදිවුරව
3. ඉරුදිනත් ණය මංගල දිනත් නිවාඩු වලංගු කරව

### ඉතිරි පනත් හත

4. මවුපියන්ට සංග්‍රහ කරව
5. ජීවිතය විනාශ නොකරව
6. කාමමිථ්‍යාචාරය නොකරව
7. සොරකම් නොකරව
8. බොරු සාක්ෂි නොකියව
9. පරදාර ආලය නොකරව
10. අන්වස්තු ආසා නොකරව

මෙම දේව පනත්වලින් පුද්ගලයාට සදාචාර සම්පන්න හා නීති ගරුක පුද්ගලයකු වීමට මග පෙන්වයි.

| දේව පනත් | අපට ලැබෙන පණිවිඩ |
|---|---|
| පළමු දේව පනත | ත්‍රිත්වික දෙවිඳුන්ට පමණක් වන්දනා කිරීමට අපට නියම වී ඇත. |
| දෙවන දේව පනත | වැදගත් හේතුවක් නොමැති ව නිකරුණේ දිවුරුම් දීමත් බොරුවට දිවුරුම් දීමත් ශුද්ධ වූ දේට ශාප කිරීමත් නොකළ යුතු ය. |
| තුන්වන දේව පනත | සම්පූර්ණ දිව්‍ය පූජා යාගයට ඉරුදින හා ණයමංගල දිනවල දී සහභාගි විය යුතු ය. විවේකී ව ගත කරමින් අනුනට උදව් උපකාර කළ යුතු ය. එම දිනවල සහ සැම දිනක ම වැරදි ක්‍රියා නොකර ශුද්ධවත් ව ගත කළ යුතු ය. |
| හතර වන දේව පනත | මිහිපිට දෙවියන් වහන්සේ නියෝජනය කරන අපේ දෙමාපියනට ගරු කළ යුතු ය. ගුරුවර-ගුරුවරියන්ට ද වැඩිමහල් අයට ද ශු. සභා ශ්‍රේෂ්ඨයන්ට ද රාජ්‍යය පාලකයන්ට ද ගරු කළ යුතු ය. |

| | |
|---|---|
| පස්වන දේව පනත | අසල්වැසියාගේ ශාරීරික හා ආධ්‍යාත්මික යහපතට ගරු කර ඔහු සමග සමාදානයෙන් ජීවත් විය යුතු අතර, අපගේ ශරීර සෞඛ්‍යය ගැන ද සැලකිලිමත් විය යුතු ය. |
| හය වන දේව පනත | අසභ්‍ය වචන කථා කිරීම, අසභ්‍ය දෑ බැලීම වැනි දෑ නොකර පිරිසිදු හිතක් හා යහපත් චරිතයක් ගොඩනගා ගත යුතු ය. |
| හත් වන දේව පනත | අනුන් සතු දේ නොගන්නටත් ඒවා ආරක්ෂා කරන්නටත් අනුන්ගේ අයිතියට ගරු කරන්නටත් පුරුදු විය යුතු ය. |
| අට වන දේව පනත | සැම කරුණක දී ම සත්‍යවාදී විය යුතු ය |
| නමවන දේව පනත | විවාහකයකු සමග ප්‍රේම සම්බන්ධතාවක් කිසි දිනක ඇති කර නොගත යුතු ය. |
| දහවන දේව පනත | ලද පමණින් සතුටු වී, අනුන්ගේ යහපත ගැන ද සතුටු වන්නට නියම වේ. |

ඉහත වගුවෙන් දස පනත අනුව ජීවත් වීමට අපට මාර්ගෝපදේශයක් ලබා දෙයි.

**ක්‍රියාකාරකම**

දස පනත අනුපිළිවෙළට ලියා නිර්මාණාත්මක මොබයිලයක් සකස් කරන්න.



**ජීවිතයට බිඳක්**

*රාත්‍රී නිදා ගැනීමට පෙර එක් එක් පනතට විරුද්ධ ව කටයුතු කළ අවස්ථා සිහිකර, වරදක් සිදු වී ඇත්නම් දෙවියන් වහන්සේගෙන් සමාව ඉල්ලන්න. නැවත එම වැරදි නොකිරීමට ඉටා ගන්න.*